# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ජූලි මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.07.20 දින නිකුත් කරන ලදී)

# සත්ව සුබසාධන

**සත්ව සුබසාධනය සැලැසීම සඳහා සහ සත්වයන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීම සඳහා ද; (475 වන අධිකාරය වූ) සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. **144.00** තැපැල් ගාස්තුව : රු. **150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී. -ඕ. 60/2025

**සත්ව සුබසාධනය සැලැසීම සඳහා සහ සත්වයන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීම සඳහා ද; (475 වන අධිකාරය වූ) සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක   දරන සත්ව සුබසාධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනතේ අරමුණු

**2.** මෙම පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) සත්වයන් කෙරෙහි කරුණාව, දයාව සහ නිසි සැලකිල්ලක් දැක්වීම සහ සතුන්ගේ ආරක්ෂාව, සුබසාධනය සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම;

(ආ) සත්වයන් කෲරත්වයට ලක්වීමෙන් ආරක්ෂා කිරීම; සහ

(ඇ) සත්වයන් භාරව සිටින තැනැත්තන් විසින් රැකවරණමය යුතුකමක් හඳුනාගැනීම සහ මහජනතාව විසින් සත්වයන්ට මානුෂීයව සැලකීම සහ සත්වයන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා ගත හැකි සෑම සාධාරණ පියවරක්ම ගැනීම.

පනතේ පරිපාලනය

**3.** 1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ පනතේ සාමාන්‍ය පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය.

PL 15831 - 465 (2026/07)

## I වන කොටස

### I වන පරිච්ඡේදය

#### සත්වයන්ට කෲර ලෙස සැලකීම

සත්වයන්ට කෲර ලෙස සැලකීමේ වරද

**4.** (1) යම් තැනැත්තකු විසින් -

(අ) පහර දීම, පයින් ගැසීම, පාගා දැමීම, අධික බර පැටවීම, අධික ලෙස වැඩ කරවීම, අධික ලෙස ඇවිද්දවීම, අධික ලෙස බෝකරවීම, වධ හිංසා පැමිණවීම, බිය ගැන්වීම හෝ අන්‍යාකාරයකින් සත්වයකු අනවශ්‍ය වේදනාවකට පත් කරන ආකාරයකින් එම සත්වයාට සැලකීම හෝ සත්වයා භාර තැනැත්තා වශයෙන් සත්වයාට එලෙස සැලකීමට අවසර දීම;

(ආ) යම් රෝගයක්, අශක්නුතාවක්, තුවාලයක් හෝ වෙනත් කාරණයක් හේතුවෙන් භාවිත කිරීමට නුසුදුසු සත්වයෙක් යම් කාර්යයකට හෝ වැඩකට හෝ වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කිරීම හෝ සත්වයා භාර තැනැත්තා වශයෙන්, යම් නුසුදුසු සත්වයකු එලෙස භාවිත කිරීමට අවසර දීම;

(ඇ) සත්වයකුගේ ස්වභාවික හැකියාව සහ ශක්තිය ඉක්මවා යන පරිදි සත්වයකුට බල කිරීම ඇතුළුව, එම සත්වයාගේ සෞඛ්‍යයට සහ සුබසාධනයට අහිතකර වන ආකාරයකට සත්වයකු යම් දෙයක් සඳහා පුහුණු කිරීම;

(ඈ) හිතාමතාම සහ අයුක්තිසහගතව සත්වයකුට යම් විෂක්, හානිකර ඖෂධයක් හෝ ද්‍රව්‍යයක් ලබාදීම සහ යම් විෂක්, හානිකර ඖෂධයක් හෝ ද්‍රව්‍යයක් සත්වයකු විසින් ලබා ගැනීමට හිතාමතාම සහ අයුක්තිසහගතව ඉඩ සැලැස්වීම හෝ ඉඩ සැලැස්වීමට තැත් කිරීම;

(ඉ) අනවශ්‍ය වේදනාවක් ඇති වන යම් ඉරියව්වකින් සත්වයකු ප්‍රවාහනය කිරීම හෝ රැගෙන යාම;

(ඊ) චලනය වීම සඳහා සත්වයකුට සාධාරණ ලෙස ඉඩ නොදෙන උසින්, දිගින් සහ පළලින් ප්‍රමාණවත් මිනුමකින් සමන්විත නොවන යම් කූඩුවක හෝ ස්ථානයක සත්වයකු තබා ගැනීම හෝ රඳවා ගැනීම;

(උ) සත්වයකු අයුක්ති සහගත කාලසීමාවක් සඳහා අයුක්ති සහගත ලෙස කෙටි හෝ අයුක්ති සහගත ලෙස බරින් යුතු දම්වැලකින් බැඳ දැමීම හෝ ලණුවකින් ගැට ගැසීම හෝ සත්වයාට අනවශ්‍ය වේදනාවක් ඇති වන ආකාරයකින් සත්වයකු බැඳ තබාගැනීම හෝ සීමාකර තබාගැනීම;

(ඌ) සත්වයකු භාරව සිටින තැනැත්තකු වශයෙන්, සත්වයකුට ආහාර, ජලය හෝ වාසස්ථාන චේතනාන්විතව අහිමි කිරීම;

(එ) සත්වයකු භාරව සිටින තැනැත්තකු වශයෙන්, එකී සත්වයා මහජනතාවට බරපතළ සහ අත්‍යාසන්න අනතුරක් සිදු කරන්නේ නම් මිස, එම සත්වයා හෝ එම සත්වයාගේ පැටවකු මරා දැමීම;

(ඒ) සත්වයකු භාරව සිටින තැනැත්තකු වශයෙන් සත්වයකු නිරාහාරව තබමින් සහ වේදනාව ඇති කරමින් නොසලකා හැරීම; සහ

(ඔ) සිතාමතාම වෙනත් යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් සත්වයකුට අනවශ්‍ය වේදනාවක් ඇති කිරීම,

නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂ පනස්දහසක්

නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

කෲර ලෙස සත්වයන් මැරීමේ වරද

**5.** කෲර ආකාරයකින් යම් සත්වයකු මැරීම සිදුකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

ගර්භනී සත්වයන් මැරීමේ වරද

**6.** (1) යම් ගර්භනී සත්වයකු, එකී සත්වයා මහජනතාවට බරපතළ සහ අත්‍යාසන්න අනතුරක් සිදු කරන විටක මිස, චේතනාන්විතව මැරීම හෝ මැරීම සඳහා බව දනිමින් ම විකිණීම හෝ බාර දීම කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර හතරක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සඳහා වන නඩු පැවරීමක දී, වරද සිදුකරනු ලැබ ඇත්තේ යම් සත්වයකු සම්බන්ධයෙන් ද, එම සත්වයා එම වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී ගර්භනී ව සිටියේ ද යන්න පිළිබඳ ප්‍රශ්නයක් මතුවුවහොත්, වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී එම සත්වයා ගර්භනීව සිටි බවට පශු වෛද්‍යවරයකු විසින් සිය අත්සන යටතේ ලබා දෙනු ලබන සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍යා විය යුතු අතර පටහැනි සාක්ෂි වේ නම් මිස එහි සඳහන් කරුණු තහවුරුවත් විය යුතු ය.

අල්ලා ගැනීමට උගුල් ඇටවීම ආදිය තහනම් බව

**7.** (469 වන අධිකාරය වූ) වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ සහ 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ විධිවිධානවලට අගතිවිරහිතව යම් තැනැත්තකු විසින්, යම් සාධාරණ හේතුවක් නොමැතිව සත්වයකු අල්ලා ගැනීම, හානි

කිරීම හෝ මැරීම සඳහා, උගුලක් ඇටවීම හෝ උගුලක් ඇටවීමට සැලැස්වීම නොකළ යුතු ය.

පක්ෂීන් නීති විරෝධීව හිරකර තබා ගැනීම තහනම් බව

**8.** යම් තැනැත්තකු විසින් -

(අ) කකුලට මුදුවක්, දම්වැලක්, ලණුවක්, නූලක් හෝ කම්බියක් සම්බන්ධ කිරීම;

(ආ) ගෙල හෝ ශරීරය වටා සිර කිරීම; හෝ

(ආ) පියාපත් කැපීම,

යන ආකාරවලින් පක්ෂියකු හිර කර තබා ගැනීම නොකළ යුතු ය.

රෝගාතුර වූ හෝ ආබාධිත සත්වයන්ට පොදු ස්ථානවල මියයාමට ඉඩ දීම තහනම් බව

**9.** යම් තැනැත්තකු විසින් සාධාරණ හේතු දැක්වීමකින් තොරව යම් රෝගාතුර වූ හෝ ආබාධිත සත්වයකුට යම් පොදු ස්ථානයක, වීදියක හෝ උද්‍යානයක මියයාමට ඉඩ ලබා නොදිය යුතු ය.

සත්වයන් අත්හැර දැමීම තහනම් බව

**10.** යම් තැනැත්තකු විසින් සත්වයකු අත්හැර දැමීම නොකළ යුතු ය.

සුදුසුකම් නොලැබූ තැනැත්තන් විසින් ප්‍රතිකාර කිරීම තහනම් බව

**11.** යම් තැනැත්තකු විසින් යම් සත්වයකුට -

(අ) පශු වෛද්‍යවරයකු හෝ 1961 අංක 31 දරන ආයුර්වේද පනත මගින් පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි, සතුන්ට ප්‍රතිකාර කිරීමේ පළපුරුද්ද සහිත ආයුර්වේද වෘත්තිකයකු හැර යම් තැනැත්තකු විසින් යම් වෛද්‍ය ප්‍රතිකාරයක්; හෝ

(ආ) පශු වෛද්‍යවරයකු විසින් හැර, යම් තැනැත්තකු විසින් යම් සැත්කම් ප්‍රතිකාරයක්,

සිදු කිරීම සඳහා ඉඩ ලබා නොදිය යුතුය.

*නීති විරෝධීව සත්වයන් පුමංගහරණය හෝ වඳ බවට පත් කිරීම තහනම් බව*

**12.** (1) සත්වයකු පුමංගහරණය කිරීම පශු වෛද්‍යවරයකු විසින් හෝ පශු වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ සිදු කරන්නේ නම් මිස, යම් තැනැත්තකු විසින් සත්වයකු පුමංගහරණය කිරීම හෝ සත්වයා පුමංගහරණයට පත් කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) යම් සත්වයකු වඳ බවට පත් කිරීම පශු වෛද්‍යවරයකු විසින් සිදු කරනු ලබන්නේ නම් මිස, යම් තැනැත්තකු විසින් සත්වයකු වඳ බවට පත් කිරීම හෝ වඳ බවට පත් කිරීමට කටයුතු සලස්වනු නොලැබිය යුතු ය.

*විලවුන් ආදිය පරීක්ෂා කිරීමට සත්වයන් භාවිත කිරීම ආදිය තහනම් බව*

**13.** නියම කරනු ලැබ ඇති කාර්ය සඳහා මිස, යම් තැනැත්තකු විසින් විලවුන්, විලවුන් අන්තර්ගත ද්‍රව්‍ය හෝ විලවුන් නිෂ්පාදන, පරීක්ෂා කිරීම සඳහා සත්වයකු යොදා ගැනීම නොකළ යුතු ය.

*විකිණීම සඳහා වන සත්වයන් වේදනාවට හෝ පීඩාවට පත් කිරීම තහනම් බව*

**14.** යම් තැනැත්තකු විසින් යම් අවස්ථානුගත කරුණු යටතේ යම් සත්වයකුට අනවශ්‍ය වේදනාවක් හෝ දැඩි පීඩාවක් ඇති කළ හැකි පරිදි, එම සත්වයා විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනයට තැබීම නොකළ යුතු ය.

*වේදනාවෙන් පෙළෙන සත්වයකු නීති විරෝධීව විකිණීම තහනම් බව*

**15.** යම් තැනැත්තකු විසින්, අසනීපයක්, රෝගයක්, අංග ඡේදනයක්, නිරාහාරවීමක්, පිපාසයක්, අධික තදබදයක් හෝ හිංසා කිරීමක් හේතුවෙන් වේදනාවට පත්ව සිටින යම් සත්වයකු වෛද්‍ය ප්‍රතිකාර සහ සත්කාර සඳහා මිස, විකිණීම හෝ විකිණීම සඳහා අර්පණය කිරීම හෝ විකිණීමට ගිවිස ගැනීම නොකළ යුතු ය:

එසේ වුව ද, රජයේ පශු වෛද්‍යවරයකුගේ අනුමතය යටතේ යම් නියම කරන ලද ආහාර පිණිස වන සත්වයකු, විකිණීම සඳහා අර්පණය කරනු ලැබිය හැකි ය.

*දඬයම ආදිය සඳහා සත්වයකු තැබීම තහනම් බව*

**16.** යම් තැනැත්තකු විසින්, වෙනත් සත්වයකු මගින් දඬයම් කිරීම, තුවාල කිරීම හෝ මැරීම සිදු කිරීමේ කාර්යය සඳහා, යම් ආකාරයකින් සත්වයකු යොදා ගැනීම නොකළ යුතු ය.

**තහනම් අවස්ථා**

**17.** (1) යම් තැනැත්තකු විසින් (මෙහි මින් මතු ''තහනම් අවස්ථා'' යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන යම් අවස්ථාවන් සඳහා සහභාගී වීම, සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම, පහසුකම් සැලසීම හෝ ප්‍රචාරණය කිරීම නොකළ යුතු ය:-

(අ) සත්වයන්ට තුවාල සිදුකරන්නා වූ හෝ සත්වයන්ගේ ජීවිත විනාශකරන්නා වූ දඩයම් ක්‍රීඩා හෝ විනෝදය පිණිස වන වෙනත් යම් ආකාරයක ක්‍රීඩා වර්ගයක්;

(ආ) යම් සත්වයකුට වෙඩි තැබීමේ හෝ එම සත්වයා දඩයම් කිරීමේ කාර්යය සඳහා, යම් සත්වයකු නිදහස් කරනු ලබන යම් වෙඩි තැබීමේ තරග ක්‍රීඩාවක් හෝ තරගයක්;

(ඇ) යම් වෙනත් සත්වයකුට ගොදුරුවීමට හෝ යම් වෙනත් සත්වයකු සමග සටන් කිරීමට පෙළඹවීමේ අරමුණින් යුතු ව (සත්වයකු බැඳීම ඇතුළුව) යම් සත්වයකු රඳවා තබා ගැනීම සිදු කරන්නා වූ යම් ක්‍රීඩා ඉසව්වක් හෝ විනෝද අවස්ථාවක්; හෝ

(ඈ) යම් සත්වයකුගේ සටන් කිරීමක් හෝ ගොදුරු කිරීමක්.

(2) යම් තැනැත්තකු විසින් තමා යම් ස්ථානයක අයිතිකරු හෝ යම් ස්ථානයක භාරකරුව සිටින්නේ ද, එම ස්ථානය තහනම් අවස්ථාවක් සඳහා භාවිත කිරීමට අවසර ලබා නොදිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් තහනම් අවස්ථාවක් සඳහා යම් සත්වයකු සැපයීම හෝ පුහුණු කිරීම නොකළ යුතු ය.

**තහනම් හැසිරීමක යෙදීම සඳහා වන දඬුවම**

**18.** 7 වන වගන්තියේ සිට 17 වන වගන්තිය දක්වා වන වගන්තිවල ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂ පනස්දහසක් නොඉක්මවන දඩයකට

හෝ වසර එකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

වැරදිවලට අදාළ විධිවිධාන යම් නිශ්චිත ක්‍රියාවන් සඳහා අදාළ නොවන බව

**19.** මේ පරිච්ඡේදයේ විධිවිධාන -

(අ) පශු වෛද්‍යාවරයකු විසින් හෝ එකී ක්‍රියාවන් සිදු කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තකු විසින් කරනු ලබන හරකුන්ගේ, මීහරකුන්ගේ, බැටළුවන්ගේ හෝ එළුවන්ගේ අං ගැලවීම, පුමංගහරණය, හන සලකුණු තැබීම, හඳුනා ගැනීමේ අංක සවි කිරීම හෝ සත්වයකුගේ නාසය විදීම හෝ පොදු ස්ථානවල අලින්ගේ සංචරණය සීමා කිරීම හෝ පශු වෛද්‍යාවරයකු විසින් නියම කරන ලද වෙනත් යම් කළමනාකරණ කටයුතු සිදු කිරීම;

(ආ) 1992 අංක 59 දරන සත්ව රෝග පනත යටතේ රෝග පාලනය සඳහා කුකුළු ආදී සත්ව ගහනය අඩු කිරීම හෝ එවැනි සතුන් විනාශ කිරීම;

(ඇ) (272 වන අධිකාරය වූ) ගෝඝාතක ආඥාපනත සහ මස් සඳහා සතුන් මැරීම පිළිබඳ වෙනත් යම් ලිඛිත නීති යටතේ සිදු කරනු ලබන ආහාර පරිභෝජනය සඳහා සතුන් මැරීම;

(ඈ) අදාළ ලිඛිත නීතිය යටතේ කුකුළන්, ප්‍රවේශ වරායන්හි සිට ගොවිපළ වෙත, බෝ කරන ස්ථානයේ සිට ගොවිපළ වෙත හෝ ගොවිපළේ සිට පිරිසැකසුම් කරන හෝ අලෙවිකරන ස්ථාන වෙත, ප්‍රවාහනය කිරීම;

(ඉ) නියම කරනු ලැබ ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව ඖෂධ හෝ විලවුන්වල පරීක්ෂා කිරීම් සඳහා සතුන් භාවිත කිරීම;

(ඊ) සත්වයකුගේ අයිතිකරුවකු හෝ ඒ සත්වයා භාරව සිටින තැනැත්තා විසින්, යම් කෘෂිකාර්මික, ආගමික, විනෝදාත්මක හෝ සංස්කෘතික ක්‍රියාකාරකමක් සඳහා එකී සත්වයාට හානියක් සිදු කිරීමෙන් තොරව භාවිත කිරීම, පුහුණු කිරීම හෝ සැපයීම;

(උ) සත්ව නිෂ්පාදන දාමය හෝ 1958 අංක 29 දරන සත්ව පනත යටතේ මස් පිණිස සතුන් මැරීම සඳහා අවශ්‍ය වන්නා වූ ආහාර ඉවත් කිරීම හෝ සීමා කිරීම;

(ඌ) 1958 අංක 29 දරන සත්ව පනත සහ (272 වන අධිකාරය වූ) ගෝඝාතක ආඥාපනත යටතේ මස් සඳහා සතුන් මැරීම හෝ සතුන් තෝරා මැරීමෙන් සත්ව ගහනය අඩු කිරීම; සහ

(එ) (469 වන අධිකාරය වූ) වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියම කරනු ලැබ ඇති නිලධරයන් විසින් වන සතුන් පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ මිනිස් ජීවිත, සත්ව ජීවිත හෝ භෝග ඇතුළු දේපළ ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන සාධාරණ පියවර,

සඳහා අදාළ නොවිය යුතු ය.

## II වන පරිච්ඡේදය

### සත්වයන් ප්‍රවාහනය කිරීම

යම් තත්ත්වයන් යටතේ සත්වයන් ප්‍රවාහනය කිරීම වරදක් වන බව

**20**. යම් තැනැත්තකු විසින් යම් සත්වයකු, එකී සත්වයාට අනවශ්‍ය වේදනාවක් හෝ පීඩාවක් හෝ එකී සත්වයාට තුවාලයක් හෝ අනතුරක් ඇති කිරීමේ ඉඩකඩ ඇති ආකාරයට රැගෙන යාම, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම හෝ රැගෙන යාමට, ගෙනයාමට හෝ ප්‍රවාහනය කිරීමට සැලසීම නොකළ යුතු ය.

සත්වයන් ප්‍රවාහනය කිරීමේ දී අදාළ වන කොන්දේසි

**21**. ඉහත සඳහන් විධිවිධානවලට අගති විරහිතව සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද ප්‍රවාහනය සඳහා වූ යම් කොන්දේසිවලට අමතරව, යම් සත්වයකු රැගෙන යන, ගෙනයන හෝ ප්‍රවාහනය කරනු ලබන යම් තැනැත්තකු විසින් පහත කරුණු තහවුරු කරනු ලැබිය යුතු ය:-

(අ) යම් සත්වයකුට පැටවීමේ දී සහ බෑමේ දී සහ ප්‍රවාහනය අතරතුර තුවාල සිදුවීම වැළැක්වීම;

(ආ) පැටවීමේ වේලාවේ සිට බෑමේ වේලාව දක්වා වන ප්‍රවාහන කාලසීමාව අතරතුර සත්වයාට ප්‍රමාණවත් ඉඩ, වාතාශ්‍රය, සනීපාරක්ෂක තත්වයන් සහ සාධාරණ සැප පහසුව ලබා දීම;

(ඇ) (i) රෝගාතුර වූ; හෝ

(ii) ගර්භනී වූ සහ ප්‍රවාහනයේ දී පැටවා බිහිකිරීමට ආසන්න වූ හෝ ප්‍රසූතියෙන් පැය හතලිස් අටක කාලයක් තුළ,

කිසිම සත්වයකු වෛද්‍ය ප්‍රතිකාර සඳහා හෝ සත්වයාගේ ම ආරක්ෂාවට මිස, රැගෙනයාම, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම;

(ඈ) සත්වයා රැගෙනයාම, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරනු ලබන යම් වාහනයකට -

(i) එහි ගෙනයන්නා වූ සත්වයා පහසුවෙන් නිරීක්ෂණය කිරීමට සහ පරීක්ෂා කිරීමට පහසුකම් සහිත වීම; සහ

(ii) එකී සත්වයා මානුෂික ආකාරයෙන් පැටවීමට සහ බෑමට තට්ටුවක් (ramp) තිබීම;

(ඉ) රැගෙන යාමට, ගෙනයාමට හෝ ප්‍රවාහනය කිරීමට භාවිත කරනු ලබන යම් වාහනයක පතුළ යම් සත්වයකුට තුවාල සිදුවිය හැකි ආකාරයේ සිදුරු හෝ පිපිරීම් ආදියෙන් තොර වීම;

(ඊ) සත්වයකු රැගෙනයාමට, ගෙනයාමට හෝ ප්‍රවාහනය කිරීමට භාවිත කරන්නා වූ යම් වාහනයක ප්‍රවාහනය කරනු ලබන සත්වයාගේ වර්ගය සැලකිල්ලට ගනිමින් අවස්ථාවට යෝග්‍ය වන පරිදි වන ආරක්ෂාවක් ලබා දීම පිණිස, ආවරණය කළ යුතු දුර ප්‍රමාණය, කාලගුණය, උෂ්ණත්වය සහ භූමිභාගය වැනි පාරිසරික කරුණුවලට, ප්‍රමාණවත් ආවරණයක් ලබා දී තිබීම;

(උ) කලහකාරීත්වයට පෙළඹෙන සත්වයකු, එකී සත්වයා අනෙක් සතුන්ට පහර දීමෙන් හෝ හානි සිදු කිරීමෙන් හෝ තුවාල සිදු කිරීමෙන් වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පූර්වාරක්ෂණයක් ගැනීමෙන් පසුව මිස, අනෙක් සත්වයන් සමග එකට රැගෙන යාම, ගෙනයාම හෝ ප්‍රවාහනය නොකිරීම;

(ඌ) පටවන ස්ථානයේ සිට බෑම සිදුකරන ස්ථානය දක්වා කරන්නා වූ යම් රැගෙනයාම, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ අයුක්ති සහගත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා තබා නොගෙන සිදු කිරීම;

(එ) ප්‍රවාහන කොන්දේසි අනුව ප්‍රවාහනය කරන අතරතුර සත්වයා ආහාර සහ ජලය ලබා දීමෙන් වැළැක්වීම අවශ්‍ය වන අවස්ථාවක දී, ප්‍රවාහන කාලය තුළ සත්වයාට ආහාර හා ජලය නොමැතිව ඉවසා සිටිය හැකි වන ප්‍රමාණයට වඩා ගමන දීර්ඝ නොවන බවට තහවුරු කිරීම;

(ඒ) අදාළ සත්ව වර්ග සැලකිල්ලට ගනිමින් නියම කරනු ලැබිය හැකි ගමනේ කාලසීමාව මත පදනම්ව සත්වයන්ට ප්‍රමාණවත් ආහාර, ජලය සහ විවේක කාලයක් ලබා දීම; සහ

(ඔ) දීර්ඝ ගමන් අතරතුර, ප්‍රායෝගික වන අවස්ථාවල දී සත්වයාට විවේකය, ආහාර හා ජලය සහ

සනීපාරක්ෂක කටයුතුවලට යාමට හැකි කරමින් ප්‍රමාණවත් පියවර ගැනීම.

නීතිවිරෝධී ප්‍රවාහනය සිදු කිරීම සඳහා දඬුවම්

**22**. 20 වන හෝ 21 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ එම විධිවිධාන උල්ලංඝනය කරන්නා වූ යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

## III වන පරිච්ඡේදය

### පරීක්ෂණ සහ ඉගැන්වීම් කාර්යයන් සඳහා සජීවී සත්වයන් භාවිත කිරීම

සත්වයන් යොදාගෙන සිදු කරනු ලබන පරීක්ෂණ

**23**. ජීවිත ආරක්ෂා කිරීම සඳහා, ජීවිතය දීර්ඝ කිරීම සඳහා, වේදනාවට සහනය සැලසීම සඳහා, යම් රෝගවලට විරුද්ධව සටන් කිරීම සඳහා, ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, මනුෂ්‍යයන්, සත්වයන් හෝ ශාක මත ඖෂධ යෙදීමේ ආරක්ෂිත බව හෝ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම සඳහා හෝ ඉගැන්වීම් සඳහා සතුන් යොදාගැනීම සඳහා උපකාර විය යුතු දැනුම නව සොයාගැනීම් මගින් වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනවත් වන පරීක්ෂණ සිදු කරනු ලැබීම පිළිබඳ මේ පනතේ අන්තර්ගත කිසිවකින් නීත්‍යානුකූල නොවනු ලබන බවට නොසැලකිය යුතු ය:

එසේ වුව ද, එකී පරීක්ෂණ සිදු කිරීමට අදාළ තීරණ ගැනීමේ දී, අදාළ පාර්ශ්වය විසින්, සජීවි සත්වයන් යොදාගෙන පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය නොවන්නා වූ පරිගණක අනුකාරක සහ අනෙකුත් ශබ්ද රූප ක්‍රම, කෘත්‍රිමව නිෂ්පාදිත ආදර්ශ, සදාචාරාත්මක වශයෙන් ප්‍රභවය ලද මළ සිරුරු සහ සායනික අත්දැකීම් ඇතුළුව විකල්ප ක්‍රම සහ උපකරණවල උපයෝග්‍යතාව පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

ඇතුල්වීමේ සහ පරීක්ෂා කිරීමේ බලය

**24**. (1) සත්ව සුහසාධන නිලධරයකු විසින් -

(අ) එකී නිලධරයා විසින් සාධාරණ යයි සලකනු ලබන යම් වේලාවක දී, සත්වයන් පිළිබඳ පරීක්ෂණ පවත්වනු ලබන යම් ආයතනයකට හෝ ස්ථානයකට ඇතුළුවීම සහ ඒවා පරීක්ෂා කිරීම; සහ

(ආ) සත්වයන් පිළිබඳ පවත්වනු ලබන පරීක්ෂණ සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ළඟ තබා ගනු ලැබූ යම් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා එවැනි තැනැත්තකුට නියම කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) සත්වයකු පිළිබඳ පරීක්ෂණ සම්බන්ධයෙන් යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයකට සහ මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමක ට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### සුරතල් සත්වයන් වශයෙන් සත්වයන් විකිණීම නියාමනය කිරීම

සුරතල් සත්ව සාප්පු සහ සුරතල් සත්වයන් බෝ කරවීමේ මධ්‍යස්ථාන නියාමනය කිරීම

**25**. (1) කිසිදු තැනැත්තකු විසින්, සුරතල් සත්ව සාප්පුවක් හෝ සුරතල් සත්වයන් බෝ කරවීමේ මධ්‍යස්ථානයක් පිහිටා ඇති ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, එකී සුරතල් සත්ව සාප්පුව හෝ සුරතල් සත්වයන් බෝ කරවීමේ මධ්‍යස්ථානය තබාගැනීම හෝ පවත්වාගෙන යාම සිදු නොකළ යුතු ය.

(2) සුරතල් සත්ව සාප්පුවක් හෝ සුරතල් සත්වයන් බෝ කරවීමේ මධ්‍යස්ථානයක් තබා ගැනීමට හෝ පවත්වාගෙන යාමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින්, පළාත් පාලන

ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තුව ගෙවීම මත, බලපත්‍රයක් ලබාගැනීම සඳහා පළාත් පාලන ආයතනය වෙත නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් ඉල්ලීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් විය යුතු අතර, එය නිකුත් කරනු ලැබූයේ කුමන කොන්දේසිවලට යටත්ව ද යන්න නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) සුරතල් සත්ව සාප්පුවක් හෝ සුරතල් සත්වයන් බෝ කරවීමේ මධ්‍යස්ථානයක් තබාගැනීම හෝ පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ ද යන්න නිශ්චය කිරීමේ දී, පළාත් පාලන ආයතනයක් විසින් පහත දැක්වෙන කොන්දේසි සැලකිල්ලට ගනු ලැබිය යුතුය :-

(අ) සෑම වේලාවකදී ම ප්‍රමාණය, උෂ්ණත්වය, වාතාශ්‍රය, ආලෝකය, හා පවිත්‍රතාව සම්බන්ධයෙන් සුදුසු ඉඩක සත්වයන් රඳවා තැබිය යුතු ය;

(ආ) සත්වයන් සඳහා කෑම සහ ජලය ප්‍රමාණවත්ව සපයනු ලැබිය යුතු ය;

(ඇ) ක්ෂීරපායින් වන සත්වයන් නියම කරනු ලබන වයසට වඩා අඩු වයසක දී විකුණනු නොලැබිය යුතු ය;

(ඈ) බෝවන රෝග පැතිරීම වැළැක්වීම සඳහා සියලු සාධාරණ පූර්ව ආරක්ෂණයන් ගනු ලැබිය යුතු ය;

(ඉ) ගින්නක් හෝ වෙනත් හදිසි අවස්ථාවක දී සුදුසු පියවර ගනු ලැබිය යුතු ය; හෝ

(ඊ) එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයාගෙන් අවශ්‍ය අනුමතය ලබා ගෙන තිබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන බලපත්‍රයක් නිකුත් කරන ලද දිනයේ සිට මාස දොළහක කාල සීමාවක් සඳහා බලපැවැත්විය යුතු අතර, වරකට වැඩිදුර මාස දොළහක කාලයක් සඳහා නැවත අලුත් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ විධිවිධාන හෝ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, එකී යම් කොන්දේසියක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

**බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම**

**26.** (1) (අ) බලපත්‍රලාභියා විසින් වැරදි සහගත, නොමඟ යවන සුළු හෝ අසත්‍ය තොරතුරු සපයනු ලැබ ඇති අවස්ථාවක දී;

(ආ) බලපත්‍රලාභියා විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඇ) බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, බලපත්‍රලාභියා විසින් එකී යම් නියමයන්ට හෝ කොන්දේසියකට පටහැනිව හෝ උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියා කරනු ලැබ ඇති අවස්ථාවක දී,

25 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක්, අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) නිකුත් කරන ලද බලපත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි අත්හිටුවනු ලබන හෝ අවලංගු කරනු ලබන අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් ලබාදෙන ලද ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිඛිත සන්නිවේදනයක් යැවීම මගින් බලපත්‍රලාභියා වෙත එකී අත්හිටුවීම හෝ අවලංගු කිරීම වහාම දැනුම් දීම පළාත් පාලන ආයතනයේ වගකීම විය යුතු ය.

අභියාචනා

**27**. (1) බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන තීරණයකින් හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තා දැනුවත් කරමින් එවන ලද ලිඛිත සන්නිවේදනය ලැබීමෙන් දින තිහක් ඇතුළත, එකී තීරණයට එරෙහිව පළාත් පාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ තීරණය, එකී අභියාචනය ලැබීමෙන් දින තිහක් ඇතුළත සිදු කරනු ලැබිය යුතු ය.

වීදි යනාදියෙහි සුරතල් සත්වයන් විකිණීමේ වරද

**28**. (අ) වීදියක යම් කොටසක, පාරක හෝ පොදු ස්ථානයක, සුරතල් සත්වයන් වශයෙන් සත්වයන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම; හෝ

(ආ) වයස අවුරුදු දහසයකට අඩු යම් තැනැත්තකු වෙත සුරතල් සත්වයකු වශයෙන් යම් සත්වයෙක් විකිණීම,

සිදු කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

සුරතල් සත්ව සාප්පු පරීක්ෂා කිරීම

**29**. (1) එකිනෙක සත්වයන් අතර බෝවන රෝග පැතිරීම වැළැක්වීම සඳහා, කලින් කල නියම කරනු ලැබිය හැකි යම් පූර්වාරක්ෂණ ක්‍රමවේදවලට යටත්ව, මේ පනත යටතේ වරදක් සිදු වී තිබේ ද හෝ වරදක් සිදුවෙමින් පවතී ද යන වග නිශ්චය කිරීමේ කාර්ය සඳහා, සත්ව සුභසාධන නිලධරයකු විසින්, දිනයේ ඕනෑම සාධාරණ වේලාවක දී යම් සුරතල් සත්ව සාප්පුවකට ඇතුළුවීම සහ එය පරීක්ෂා කිරීම කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සුරතල් සත්ව සාප්පුවකට ඇතුල්වීම සහ පරීක්ෂා කිරීම සඳහා තමා සතු බලය ක්‍රියාත්මක කරන යම් තැනැත්තකුට සිතාමතා බාධා කරන හෝ පමා කරන යම්

තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට සහ මාස තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

(3) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා "සුරතල් සත්ව සාප්පු" යන්නෙන් පෞද්ගලික නිවාසයක් ඇතුළුව සුරතල් සත්වයන් වශයෙන් සත්වයන් විකිණීමේ ස්වරූපයේ යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සහ එවැනි යම් භාරකරු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එවැනි යම් සත්වයන් තබාගන්නා හෝ නඩත්තු කරන යම් පරිශ්‍රයක් අදහස් වේ.

## II වන කොටස

### සත්ව සුභසාධන උපදේශක කමිටුව පිහිටුවීම

සත්ව සුභසාධන උපදේශක කමිටුව පිහිටුවීම

**30**. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව සුබසාධන උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් -

(i) පශු සම්පත් සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ii) පළාත් පාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(iii) ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(iv) 1992 අංක 59 දරන සත්ව රෝග පනත යටතේ පත් කරන ලද සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(v) වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(vi) 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත මගින් පත් කරන ලද ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(vii) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත මගින් පත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(viii) සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා;

(ix) පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(x) ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ සභාපතිවරයා; සහ

(xi) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය සහ පශු විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් -

(i) පශු සම්පත් සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන සත්ව සුබසාධනයෙහි ක්‍රියාකාරීව නිරත වන පශු වෛද්‍යවරයකු;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නම්කරනු ලබන, පිළිවෙලින් සත්ව විද්‍යාව, සත්ව නිෂ්පාදන විද්‍යාව සහ ජලජීවි විද්‍යාව යන ක්ෂේත්‍රවල සත්වයන් යොදාගෙන සිදු කරන පරීක්ෂණවල නිරතවන ශාස්ත්‍රඥයන් තිදෙනෙකු;

(iii) පරීක්ෂණාගාර සත්වයන් පිළිබඳ කටයුතු කරනු ලබන ලියාපදිංචි සංගම් විසින් නම් කරනු ලබන එක් තැනැත්තෙක්;

(iv) ලියාපදිංචි සත්ව සුබසාධක සංගම්වලින් තැනැත්තන් පස්දෙනෙක්; සහ

(v) කුකුළු සහ පශු සම්පත් ව්‍යාපාර නියෝජනය කරමින් තැනැත්තන් දෙදෙනෙක්; සහ

(vi) 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙක්.

(2) අමාත්‍යවරයා විසින් එම උපදේශක කමිටුවේ සාමාජිකයන් අතරින් උපදේශක කමිටුවේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(3) කලින් කලට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, -

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම;

(ආ) සත්වයන්ගේ ආරක්ෂාව සහ සත්වයන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීම සඳහා ගනු ලැබිය යුතු පියවර;

(ඇ) සත්ව සුබසාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම;

(ඈ) සියලුම අංශ සහ මහජනතාව අතර මේ පනතේ පරමාර්ථ පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම;

(ඉ) සත්වයන්ට මානුෂීයව සැලකීම සහ සත්වයන්ගේ සුබසාධනයට අදාළව අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම;

(ඊ) සත්වයන් පිළිබඳ පරීක්ෂණ සඳහා වන පරීක්ෂණාගාර පහසුකම් සම්බන්ධ යම් කාරණා; සහ

(උ) මේ පනත යටතේ සාදනු ලැබීමට නියමිත නියෝගවලට අදාළ යම් කාරණා,

සම්බන්ධව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම උපදේශක කමිටුවේ කාර්ය විය යුතු ය.

(4) උපදේශක කමිටුව අවම වශයෙන් සෑම මාස තුනකට වරක් ම රැස්විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් පත්කරන ලද උපදේශක කමිටුවේ සෑම සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් සිය ධුරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, ඔහු එම ධුරයට පත් කරනු ලැබ දින සිට වසර තුනක කාල සීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(6) උපදේශක කමිටුව විසින්, එහි රැස්වීම්වලට අදාළව සහ එහි කාර්ය ඉටුකිරීමට අදාළව එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(7) උපදේශක කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් දහතුන්දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

## III වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

යම් සත්වයකු කෲරත්වයට ලක් නොකළ යුතු බව

**31**. (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම ක්‍රියාව කරනු ලබන්නේ මානුෂීය ක්‍රමයකට නම් මිස, කිසිදු සත්වයකු මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අවසර දී ඇති යම් ක්‍රියාවකට යටත් නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "මානුෂීය ක්‍රමය" යන්නෙන් යම් සත්වයකුට අවම ප්‍රමාණයේ දැඩි වේදනාවක්, වේදනාවක්, පීඩාවක්, හෝ වදහිංසාවක් ඇති වන ආකාරයෙන් ක්‍රියාවේ යොදවනු ලබන හෝ ඉටු කරනු ලබන යම් ක්‍රියාවක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් ලක්ෂ හතරක් නොඉක්මවන දඩයකට සහ වසර දෙකක් නොඉක්මවන බන්ධනාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

මේ පනත යටතේ වන වැරදි සංඥෙය වැරදි විය යුතු බව

**32**. මේ පනත යටතේ වන සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ අර්ථානුකූලව සංඥෙය වැරදි ලෙස සලකනු ලැබිය යුතු ය.

වරදක් සිදු කිරීම හෝ අඛණ්ඩව සිදු කිරීම වැළැක්වීම

**33**. විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා, සත්ව සුබසාධන නිලධරයකු විසින් උප පොලිස් කොස්තාපල්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් සහිත පොලිස් නිලධරයකු සමග මහෙස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තුවක් ලබා ගැනීමෙන් පසු -

(අ) මේ පනත යටතේ වන වරදක් සිදු කර තිබෙන බවට, සිදු වෙමින් පවතින බවට හෝ සිදුවිය හැකි බවට විශ්වාස කිරීමට ඔහු වෙත හේතු පවතින අවස්ථාවක දී, යම් පරිශ්‍රයකට ඇතුළුවීම හා පරීක්ෂා කිරීම;

(ආ) එවැනි පරිශ්‍රයක පවත්වාගෙන යන සත්වයන්ට අදාළ යම් පොත්, ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික දත්ත සහ වාර්තා පරීක්ෂා කිරීම;

(ඇ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට අත්‍යාසන්න වීම සම්බන්ධයෙන්, එවැනි යම් පරිශ්‍රයක යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම; හෝ

(ඈ) එවැනි වරදක් සම්බන්ධ යම් ඡායාරූපයක් හෝ වීඩියෝවක් ලබා ගැනීම,

කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, තොරතුරු ලද අවස්ථාවක දී, වරදක් සිදුවීම හෝ වරදක් අඛණ්ඩව සිදුවීම වැළැක්වීම සඳහා හෝ මේ පනත යටතේ වන වරදක් සිදුවීම පිළිබඳ සාක්ෂියක් සංස්ථාපනය කළ හැකි යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් විනාශ කිරීම වැළැක්වීම සඳහා හෝ යම් සත්වයකුගේ සුබසාධනය තහවුරු කිරීම සඳහා (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයන් හි සඳහන් යම් පියවරක් ගැනීම ඉතා ඉක්මනින් සිදු කළ යුතු බව, එකී සුබසාධන නිලධරයාගේ මතය වන අවස්ථාවක දී, වරෙන්තුවක් ලබා ගැනීමට පෙර එකී නිලධරයා විසින් (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයන් හි සඳහන් යම් පියවරක් ගැනීම නීත්‍යානුකූල වන අතර, එම නිලධරයා විසින් එම පියවර ගත් අවස්ථාවේ සිට පැය විසි හතරක කාලයක් තුළ ඔහු විසින් එසේ ගන්නා ලද පියවර සහ වරෙන්තුවක් ලබා ගැනීමෙන් තොරව එම පියවර ගැනීමට බලපෑ හේතු පිළිබඳ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

**34**. (1) 33 වන වගන්තිය යටතේ සිදුකරන ලද විමර්ශනයකින් පසුව, සත්වයකු - සත්ව සුබසාධන විධාන නිකුත් කිරීම

(අ) රැකබලා නොගන්නා බව;

(ආ) නිර්දේශිත පශු පාලනය හෝ සත්වයන් පෝෂණය කිරීමේ පරිචයන්ට අනුව ප්‍රමාණවත් ආහාර, ජලය හෝ වාසස්ථාන සපයනු නොලබන බව;

(ඇ) අධික වේදනාවෙන් පසුවන බව;

(ඈ) පශු වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය කරන බව; හෝ

(ඉ) වැඩ කිරීමට නුසුදුසු අවස්ථාවක වැඩ කරන බව,

විශ්වාස කිරීම සඳහා සත්ව සුභසාධන නිලධරයකුට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, ඔහු විසින්, සත්වයා භාරව සිටින තැනැත්තා වෙත, මේ පනතේ උපලේඛනයේ සඳහන් ''අ'' ආකෘති පත්‍රයේ පරිදි (මෙහි මින් මතු ''විධානය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සත්ව සුබසාධන විධාන'' යනුවෙන් හැඳින්විය යුතු ලිඛිත විධානයක්, නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලැබීමෙන් පසුව එම සත්වයා භාරව සිටින තැනැත්තා විසින් ඒ සඳහා ප්‍රතිකර්ම පියවර ගැනීම සහ විශේෂයෙන් පහත දැක්වෙන එක් කාර්යයක් හෝ කිහිපයක් කිරීම කළ යුතු ය:-

(අ) විධානයෙහි සඳහන් කර ඇති ආකාරයට සත්වයා රැකබලා ගැනීම හෝ සැලකීම;

(ආ) විධානයෙහි සඳහන් කර ඇති ආකාරයට ආහාර, ජලය, විවේකය, වාසස්ථාන හෝ වෙනත් ජීවන තත්වයන් සත්වයාට සැපයීම;

(ඇ) (අ) වන හෝ (ආ) වන ඡේදයන්හි සඳහන් යම් කාර්යයන් සඳහා සත්වයා වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම; හෝ

(ඇ) විධානයෙහි සඳහන් කර ඇති යම් වේලාවක් හෝ යම් දිනයක් දක්වා සත්වයා තබාගෙන සිටින ස්ථානයෙන් ඉවත් කිරීමෙන් වැළකීම.

(3) සත්ව සුබසාධන නිලධරයකු විසින් සත්වයාගේ උපරිම යහපත පිණිස එසේ සිදුකරන ලද බවට එම නිලධරයාගේ අදහස වන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රතිකර්ම පියවර ගැනීම (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය. එවැනි අවස්ථාවක දී සත්ව සුබසාධන නිලධරයා විසින් එකී පියවර ගැනීම සඳහා ඔහුට හේතු වූ කරුණු වාර්තා කර එම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ඒ පිළිබඳ පැමිණිල්ලක් සිදු කළ යුතු ය.

(4) සාධාරණ හේතු නොමැතිව (1) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයක් සමග අනුකූලවීමට අපොහොසත් වන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම, එනයින්ම යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් මේ පනත යටතේ වන වරදක් සඳහා නඩු කටයුත්තක් ආරම්භ කිරීම සඳහා අගතියක් නොවිය යුතු ය.

විමර්ශනය හා නඩු විභාගය අතර කාලය තුළ සත්වයන් ඔවුන්ගේ සුභසාධනය තහවුරු කිරීම සඳහා ඔවුන්ගේ වාසස්ථානවල තැබීම හා රැකබලා ගැනීම

**35**. සත්වයකු සම්බන්ධයෙන් යම් වරදක් සිදුව ඇති විට, සිදුවෙමින් පවතින බවට හෝ සිදුවිය හැකි අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයකු විසින්, පොලිස් නිලධරයකු හෝ සත්ව සුබසාධන නිලධරයකු විසින් සිදු කරන ලද ඉල්ලීමක් මත හෝ ඔහුගේ ම මෝසමක් මගින්, එම වරද අඛණ්ඩව සිදු වීම වැළැක්වීම සඳහා හෝ එකී සත්වයාට අවශ්‍ය රැකවරණය හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීමේ කාර්ය සඳහා එම සත්වයා -

(අ) සත්ව රැකවරණ මධ්‍යස්ථානයක්;

(ආ) සත්ව සුබසාධනය මූලික පරමාර්ථයක් වන රාජ්‍ය නොවන සංවිධානයක්; හෝ

(ඇ) 39 වන වගන්තියේ පිළිවෙළින් (අ) හෝ (ආ) ඡේදවල සඳහන් තැනැත්තෙක්,

වෙත තැබිය යුතු බවට ආඥා කළ හැකි ය.

සත්ව සුබසාධන නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට බාධා කිරීම වරදක් විය යුතු බව

**36**. මේ පනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සත්ව සුබසාධන නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට බාධාකරන හෝ විරුද්ධ වන යම් තැනැත්තෙක් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

නඩු පැවරීම ආරම්භ කළ හැක්කේ කා විසින් ද යන වග

**37**. මේ පනත යටතේ වන වරදක් සඳහා -

(අ) සත්ව සුබසාධන නිලධරයකු විසින්;

(ආ) සාම නිලධරයකු විසින්; හෝ

(ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136(1) (අ) වගන්තිය ප්‍රකාරව අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකුට කරන ලද පැමිණිල්ලක් පදනම් කරගත් යම් තැනැත්තකු විසින්,

නඩු කටයුතු ආරම්භ කිරීමක් කළ හැකි ය.

වරදකරු කිරීමෙන් පසු, රාජසන්තක කිරීම සහ වියදම් ප්‍රතිපූර්ණය කිරීම

**38**. (1) මේ පනත යටතේ සත්වයකු සම්බන්ධයෙන් වන වරදකට යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, පැනවිය හැකි යම් දඬුවමකට අමතරව -

(අ) වරද සිදු කිරීමට අදාළ වූ සත්වයා රාජසන්තක කිරීම;

(ආ) වරද සිදු කිරීමේ දී භාවිත කරනු ලැබූ යම් ආයුධයක්, භාණ්ඩයක් හෝ වාහනයක් රාජසන්තක කිරීම; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව යම් සත්වයකු රැකවරණය හා භාරකාරත්වය යටතේ තබන ලද යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම,

සඳහා ආඥාවක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කිරීමේ දී, සත්වයා රැකබලා ගැනීම හෝ භාරකාරත්වය -

(අ) සත්ව රැකවරණ මධ්‍යස්ථානයක්;

(ආ) සත්ව සුබසාධනය මූලික පරමාර්ථය වන යම් රාජ්‍ය නොවන සංවිධානයක්; හෝ

(ඇ) සත්වයින්ගේ රැකවරණය සම්බන්ධ කටයුතුවල ක්‍රියාකාරීව නිරතවන බවට අධිකරණය සෑහීමට පත්වන යම් තැනැත්තකු,

වෙත ලබා දිය යුතු බවට විධාන කළ හැකි ය.

(3) එවැනි සත්වයකුට රැකවරණය සැපයීම අවස්ථාවෝචිත පරිදි එවැනි, සත්ව රැකවරණ මධ්‍යස්ථානයක, රාජ්‍ය නොවන සංවිධානයක හෝ තැනැත්තකුගේ කාර්ය විය යුතු ය.

(4) ආයුධයේ, උපකරණයේ හෝ වාහනයේ අයිතිකරු, වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ කලත්‍රයා හෝ දරුවා නොවන යම් තුන්වන පාර්ශ්වයක් වන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන රාජසන්තක කිරීමේ ආඥාවක් කරනු නොලැබිය යුත්තේ කුමක් හෙයින් ද යන හේතු දැක්වීමට එකී අයිතිකරු වෙත දැන්වීමක් ලබා දීමෙන් පසුව පමණක් එවැනි ආඥාවක් කරනු ලැබිය යුතු අතර, අයිතිකරු

විසින් වරද සිදු කිරීමේ දී ආයුධය, උපකරණය හෝ වාහනය භාවිත කිරීම වැළැක්වීමට සියලු පූර්වාරක්ෂණ ඔහු විසින් ගනු ලැබ ඇති බව හෝ ආයුධය, උපකරණය හෝ වාහනය ඔහුගේ දැනීමකින් තොරව ඒ සඳහා භාවිත කරනු ලැබ ඇති බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි ආඥාවක් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, දෙවන වර වරදක් කිරීම සඳහා එකී ආයුධය, උපකරණය හෝ වාහනය භාවිත කරනු ලැබ ඇති අවස්ථාවක දී, මහේස්ත්‍රාත්වරයා විසින් එම ආයුධය, උපකරණය හෝ වාහනය රාජසන්තක කිරීමේ ආඥාවක් කළ යුතු ය.

(5) අධිකරණය විසින් කරන ලද ආඥාවක් මගින් රජය වෙත රාජසන්තක කර ගනු ලබන යම් සත්වයෙක්, ආයුධයක්, උපකරණයක් හෝ වාහනයක් –

(අ) එකී ආඥාවට එරෙහිව කිසිදු අභියාචනාවක් ඉදිරිපත් කරනු නොලැබුවේ නම්, එකී ආඥාවට එරෙහිව යම් අභියාචනාවක් ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාව ඉකුත්වන දින සිට බලාත්මක වන පරිදි පරම වශයෙන් රජය වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) එකී ආඥාවට එරෙහිව යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, අභියාචනයේ දී අවසන් ආඥාව තහවුරු කරනු ලැබූ දින සිට බලාත්මක වන පරිදි පරම වශයෙන් රජය වෙත පවරනු ලැබිය යුතු ය; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

සත්වයන් සම්බන්ධ නඩුවලට මැදිහත් වීමේ අයිතිය

**39**. සත්වයකු අධිකරණ නඩු කටයුත්තක විෂය වස්තුව බවට පත්ව ඇති අවස්ථාවක දී -

(අ) සත්ව සුබසාධන සමිතියක් විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු; හෝ

(ආ) සත්වයා වෙනුවෙන් නියෝජනයක් සිදු කිරීම සඳහා අවස්ථානුකූල කරුණු යටතේ සුදුසු යම් තැනැත්තකු බවට අධිකරණයේ මතය වන අවස්ථාවක දී, එම තැනැත්තා,

සත්වයාගේ යහපත ආරක්ෂා කිරීම පිණිස අධිකරණ නඩු කටයුත්තකට මැදිහත්වීම නීත්‍යානුකූල වන්නේ ය.

වැරදි සඳහා දඬුවම් ප්‍රකාශිතව ම සඳහන් කර නොමැති අවස්ථාවක දී දඬුවම

**40**. වරදක් සඳහා දඬුවම ප්‍රකාශිතව ම සඳහන් කර නොමැති, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වන වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**41**. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරන අවස්ථාවක දී, -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එකී සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු ඔහු විසින් ඒ වරද ඔහුගේ අනුදැනුමක් නොමැතිව සිදු කළ බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ බව ඔප්පු කරන්නේ නම්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

**වරදට අනුබල දීම**

**42**. මේ පනත යටතේ වරදක් කිරීම සඳහා අනුබල දෙන ලද හෝ වරදක් සිදු කිරීමට උත්සාහ කරන හෝ කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර වරදකරු කරනු ලැබීමක දී එම වරද සඳහා ලබා දෙන දඬුවමට සමාන දඬුවමකට යටත් විය යුතු ය.

**නඩු පැවරීම සඳහා කාලසීමාව**

**43**. මේ පනත යටතේ සිදු කරන ලද වරදක් සඳහා වරද සිදු කිරීමේ දින සිට මාස දොළහක කාලයක් ඉක්මවීමෙන් පසු නඩු පැවරීමක් නොකළ යුතු ය.

**සත්ව සුබසාධන නිලධරයකු විසින් සද්භාවයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂාව**

**44**. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ සත්ව සුබසාධන නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඔහුට විරුද්ධව සිවිල් නඩුවක් සම්බන්ධයෙන් පැවරීම හෝ වෙනත් නඩු කටයුත්තක් පැවරීම සිදු නොකළ යුතු ය.

**මුක්තිය**

**45**. මේ පනතේ විධිවිධාන, පළිබෝධකයෙක් හෝ පළිබෝධ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා හෝ යම් ලිඛිත නීතියක් යටතේ මිනිස් ජීවිත, සත්ව ජීවිත හෝ භෝග ඇතුළුව දේපළ ආරක්ෂා කිරීම සඳහා ගනු ලැබූ යම් සාධාරණ පියවර සඳහා අදාළ නොවිය යුතු ය.

**ඉවත් කිරීම සහ ව්‍යාවර්ථන**

**46**. (1) (475 වන අධිකාරය වූ) සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (මෙහි මින් මතු “ඉවත් කරන ලද ආඥා පනත” යනුවෙන් සඳහන් කරනු ලබන) සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥා පනතේ ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද ආඥා පනත යටතේ, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයෙහි, නිසි බලය ඇති අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් ඇතුළත් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ, ආඥා සහ නඩු තීන්දු මේ පනත ක්‍රියාත්මක වන දින සිට

බලාත්මක වන පරිදි මේ පනත යටතේ ඇතුළත් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව බලාත්මක කළ හැකි ය; සහ

(ආ) ඉවත් කරන ලද ආඥා පනත යටතේ සාදනු ලැබූ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පැවති මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන සෑම නියමයක්ම සහ රීතියක් ම මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක් අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

නියෝග

**47**. (1) මේ පනත මගින් සඳහන් කරනු ලැබ ඇති හෝ නියම කරනු ලැබිය යුතු යැයි නියමිත සියලු කරුණු හෝ නියෝග සෑදිය යුතු යැයි මේ පනත මගින් නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් උපදේශක කමිටුව විමසා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දැක්වෙන යම් කරුණක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිත සහ පරිචයන් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන අවස්ථාවල දී, අමාත්‍යවරයා විසින් උපදේශක කමිටුව විමසා නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) යම් සත්වයකු විසින් ඉසිලිය හැකි හෝ ඇදගෙන යා හැකි උපරිම බර;

(ආ) යම් වාහනයක, කූඩුවක හෝ කොටුවක ප්‍රමාණය ඉක්මවා සත්වයින් ගාල්කිරීම වැළැක්වීම සඳහා නිරීක්ෂණය කළ යුතු තත්ත්වයන්;

(ඇ) ඕනෑම වර්ගයක ලෝහමය මුව වැස්මක් හෝ අස් ඇඳුමක් භාවිත කිරීම සහ අශ්වලාඩම්කරුවකුගේ කටයුත්ත මෙහෙයවන ආකාරය නියාමනය කිරීම;

(ඈ) සත්වයින් ඇල්ලීමේ දී ගත යුතු පූර්වාරක්ෂණයන්;

(ඉ) සත්වයින් ප්‍රවාහනය කරනු ලැබිය හැකි ආකාරයන් හා කොන්දේසි;

(ඊ) සත්වෝද්‍යානයට සහ මින්මැදුරට අදාළ කොන්දේසි;

(උ) වාණිජ පදනමක් මත පවත්වාගෙන යන ලැලි ගසා සකස් කළ බලු කූඩු, සුරතල් සත්වයන් සඳහා ඇති නේවාසිකාගාර හා ඊට සමාන වෙනත් ආයතන;

(ඌ) විනෝද උද්‍යානයන්හි සිටින සත්වයින්ට හා රංගනයේ යෙදෙන සත්වයින්ට අදාළ කොන්දේසි;

(එ) පරීක්ෂණ කටයුතුවලට සත්වයින් යොදාගැනීමට අදාළ කොන්දේසි;

(ඒ) සිරකර ඇති සත්වයින්ගේ හා නිදැල්ලේ හැසිරෙන සත්වයින්ට අදාළ කොන්දේසි;

(ඔ) සත්ව සුබසාධනයට අදාළ ව්‍යවහාර සංග්‍රහ සකස් කිරීම;

(ඕ) සුරතල් සත්ව සාප්පුවලට අදාළ කොන්දේසි සහ සත්වයින්ගේ පළිබෝධ පාලනයට අදාළ කොන්දේසි;

(ක) පශු සම්පත් සහ සන්ධානගත කර්මාන්තවලට අදාළ කොන්දේසි;

(ග) සත්වයින් විකුණනු නොලැබිය යුතු වයස;

(ච) විලවුන්වලට, විලවුන් සෑදීම සඳහා යොදාගන්නා ලද ද්‍රව්‍ය හෝ විලවුන් නිෂ්පාදන සඳහා භාවිත කරනු ලැබිය හැකි සත්වයින් සම්බන්ධයෙන් වන කාර්ය;

(ජ) සත්ව පුහුණුව සඳහා වන කොන්දේසි;

(ට) සත්වයින් තබාගැනීමට සහ සත්වයන් බෝ කරවීමේ පිළිවෙත්වලට අදාළ කොන්දේසි;

(ඩ) රෝගීවීමක දී හෝ තුවාල සිදුවීමක දී සත්වයින්ට රැකවරණය ලබාදීමට අදාළ කොන්දේසි; සහ

(ණ) සත්ව රැකවරණ මධ්‍යස්ථාන, රාජ්‍ය නොවන සංවිධාන හෝ 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් පවත්වාගත යුතු අනුමතය ලබාගැනීමේ ක්‍රමවේදය සහ එවැනි ආයතන සහ තැනැත්තන් පිහිටුවීමට, අධීක්ෂණය කිරීමට හා විමර්ශනය කිරීමට අදාළ ක්‍රමවේදයන්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරන ලද දින සිට හෝ එකී නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් දිනයක දී බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන්, මාස තුනකට පසු පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**48**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි - අර්ථ නිරූපණය

"සත්වයා" යන්නෙන්, මිනිසා හැර යම් පණ ඇති ජීවියකු අදහස් වන අතර ඊට ගෘහාශ්‍රිත සතුන්, ගොවිපළ ආශ්‍රිත සතුන්, සිර කර ඇති සතුන්, වන සතුන්, මිනිසුන් හා සමීප සතුන්, ජලජ සතුන්, නිදැල්ලේ හැසිරෙන සතුන් සහ ආහාරය සඳහා යොදා ගන්නා සතුන් ඇතුළත් වේ;

“සත්ව රැකවරණ මධ්‍යස්ථානය” යන්නෙන්, පශු වෛද්‍ය සායනයක් හෝ සත්ව රෝහලක් හැර සත්වයින්ට රැකවරණය ලබා දෙන ස්ථානයක් අදහස් වේ;

“සත්ව සුභසාධන නිලධරයා” යන්නෙන්, යම් රජයේ පශු වෛද්‍යවරයෙක් අදහස් වේ;

“සත්ව සුබසාධන සමිතිය” යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සත්ව සුබසාධන සමිතියක් හෝ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි කරන ලද රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ;

“කූඩුව” යන්නට, කොටුකල ගාල, බලු කූඩුව, මඩුව හෝ ඊට සමාන වෙනත් ස්ථානයක් ඇතුළත් වේ;

“සීමාකිරීම” යන්නෙන්, සත්වයකුට අදාළව -

(අ) පිවිසීම සහ සංචලනයට ඇති නිදහස සීමාකරමින් කූඩුවක, වළක, අංගනයක, පිටියක හෝ වෙනත් කොටුවක කොටු කිරීම; සහ

(ආ) පියාපත් බඳිමින්, දිගේලි කරමින් හෝ වෙනත් ආකාරයේ අවහිරයක් සිදු කිරීම,

ඇතුළුව සත්වයින්ට සංචලනය සඳහා ඇති නිදහස සීමා කිරීම අදහස් වේ;

“රජයේ පශු වෛද්‍යවරයා” යන්නෙන්, සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ යම් පශු වෛද්‍යවරයකු අදහස් වේ;

“ගිලන්හල” යන්නෙන්, රෝගී හෝ වයස්ගත හෝ ආබාධිත සත්වයින් ඇති කිරීමට පිහිටුවන ලද වාසස්ථානයක් අදහස් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 හෝ 45 ව්‍යවස්ථාවලට අනුව මෙම පනත පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

“අධික ලෙස ඇවිදීම” යන්නෙන්, සත්වයකුට අදාළව දරුණු හෝ පීඩාකාරී තත්ත්වයන් යටතේ බලෙන් සිදු කරනු ලබන ඇවිද්දවීම අදහස් වේ;

“වේදනාව” යන්නට, පීඩාව සහ මානසික හෝ කායික විඳවීම ඇතුළත් වේ;

“සාම නිලධරයා” යන්නට, ආණ්ඩුවේ ඕනෑම පශු වෛද්‍යවරයකු ඇතුළත් වේ;

“තැනැත්තා” යන්නට, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

“පළිබෝධ” යන්නට, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

“පියාපත් බැඳීම” යන්නෙන්, පක්ෂියකුට අදාළව පක්ෂියකුගේ පියාපත් අක්‍රීය කිරීම හෝ පක්ෂියකුගේ පියාපතකින් කොටසක් ඉවත් කිරීම අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, මේ පනත යටතේ නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ;

"වාසස්ථාන" යන්නෙන්, සත්වයන් සුරක්ෂිතව ඇති කිරීම සහ නඩත්තු කිරීම සඳහා නිවහනක් හෝ ගිලන්හලක් හෝ වෙනත් යම් ස්ථානයක් හෝ සංක්‍රමණය වන ස්ථානයක් අදහස් වේ;

"උගුල" යන්නෙන්, සත්වයකු මරණයට පත්කිරීම, උගුලකට හසුකර ගැනීම, පටලවා ගැනීම, හික්මවීම හෝ අක්‍රීය කිරීම යන කාර්ය සඳහා යොදාගනු ලබන දැලක්, කූඩුවක්, මලපුඩුවක්, කොටුකළ ගාලක්, බොරුවලක් හෝ විද්‍යුත් උපකරණයක් හෝ යාන්ත්‍රික දෙයක් අදහස් වන අතර, ඊට -

(අ) ඉඩමක කොටුකරන ලද යම් ප්‍රදේශයක් හෝ සත්වයකු හැසිරවීම, රැළට යැවීම හෝ රැස්කිරීම සඳහා යොදාගන්නා වෙනත් සුදුසු කොටුවක්; හෝ

(ආ) සත්වයකු ප්‍රවාහනය කිරීම සඳහා යොදාගන්නා කූඩුවක් වැනි යම් කොටුවක්;

ඇතුළත් නොවේ;

"වාහනය" යන්නෙන්, ප්‍රවාහන මාධ්‍යයක් වශයෙන් යොදාගන්නා යම් වාහනයක් අදහස් වේ;

"පශු වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය

වෘත්තික පනත යටතේ ලියාපදිංචි වූ පශු වෛද්‍යවරයකු අදහස් වේ;

“සත්වයෙකුගේ පශු වෛද්‍ය ප්‍රතිකාරය” යන්නෙන්,

(අ) සත්වයකුගේ තත්ත්වය පිළිබඳ පශු වෛද්‍යවරයකුගෙන් උපදෙස් ලබා ගැනීම;

(ආ) පශු වෛද්‍යවරයකු විසින් සත්වයකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෛද්‍ය හෝ ශල්‍යමය ක්‍රියාවලියක්, හෝ

(ඇ) සත්වයකු සම්බන්ධයෙන් සිදුකරනු ලබන සුව කිරීමේ හෝ වැළැක්වීමේ ස්වභාවයේ වෛද්‍ය ක්‍රියාවලියක්,

අදහස් වේ;

“සත්වයකුගේ සුබසාධනය” යන්නට, සත්වයකුගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ යහපැවැත්ම ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**49**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

[34 වන වගන්තිය]

## උපලේඛනය

'අ' ආකෘතිය

## සත්ව සුබසාධනය පිළිබඳ විධානය

සත්වයා භාරව සිටින තැනැත්තාගේ නම:-

ලිපිනය:-

සත්වයා තබා ඇති ස්ථානයේ ලිපිනය:-

සත්වයාගේ හඳුනාගැනීමට ලක්ෂණ, ඇත්නම්:-

විශේෂ සලකුණු, ඇත්නම්:-

සත්වයාගේ ලිංගිකත්වය, පෙළපත සහ වර්ගය:-

සත්වයාව තබා ඇති තත්ත්වයන්:-

නිකුත් කරන ලද විධාන:-

වෙනත් කරුණු ඇත්නම්:-

දිනය සහ වේලාව:-

පරීක්ෂකවරයාගේ අත්සන:-

නම සහ තනතුර:-

<u>සත්වයා භාරව සිටින තැනැත්තා විසින් කරනු ලබන ප්‍රකාශය</u>

ඉහත කී සත්වයා/සත්වයින්ගේ සුබසිද්ධිය උදෙසා මා වෙත නිකුත් කරන ලද ඉහත සඳහන් විධාන පිළිපැදීමට මම එකඟවෙමි. එකී විධානවලට අනුකූලවීමට මෙයින් පොරොන්දු වන අතර ඊට අපොහොසත්වීම සත්ව සුබසාධන පනතේ විධිවිධාන කඩකිරීමක් සඳහා ගාස්තු අයකරනු ලැබීමට යටත් විය හැකි බව මා දැනුවත්ව සිටිමි.

සත්වයා භාරව සිටින තැනැත්තාගේ අත්සන:-

දිනය:-

(පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී ඒ සඳහා අධීක්ෂකවරයා විසින් ගනු ලබන පියවර වෙනත් කරුණු තීරයේ සටහන් කරනු ලැබිය යුතු ය.)